

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

**අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි උපත් සියවස් සමරු කලබ**



| | | |
|---|---|---|
| **56 වන කාණ්ඩය** | **බු.ව.2556 පොසොන් මස පුරපසළොස්වකදා ක්‍රි.ව.2013 ජූනි මස 23 වන දා** | **02 වන කලබ** |



# වඳිම් මිහිඳු හිමිඳුන් සිරිපා කමල

උතුම් දඹ දිව'ග අශෝකසක්විතින් වන
විකුම් තෙද බලැතියන් හට මුඳුන් වන
නොහිම් සැදැහැ ඇති මහඋවසුවන් වන
දහම් සෝ රජාණන් පුතණුවන් වන

තුන් වන දම් සභායෙහි දෙටු තෙරුන් වන
පන්සිය පරවාද මැඬි පඬිරුවන් වන
නන්දෙස බුදුසසුන් යැවු හිමිසඳුන් වන
පින් පිඬු මොගලිපුත්තිසුන'ග සිසුන් වන

උතුම් බුදුසසුන ඇති කර හැර කසළ
දහම් දිව බවට පෙරළූ මෙලක් තල
නොහිම් ගුණැති බුදු කෙනකුන් වැනි අතුල
වඳිම් මිහිඳු හිමිඳුන් සිරිපා කමල

**- පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමිපාණෝ**



# බුදු බව පතන මහ නාහිමිපාණෝ

**ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත**
**පූජ්‍ය හක්මන සුමනසිරි හිමිපාණෝ**

1913 ජූනි මස 21 වනදා මාතර මඩිහේ දී ජන්ම ලාභය ලබා තෙළෙස් වන වියෙහි දී කඹුරුගමුවේ දේවගිරි විහාරාධිපති වැ වැඩ විසූ අතිගරු වේරගම්පිටියේ සිරි රේවත මාහිමිපාණන් ගේ උපාධ්‍යායත්වයෙන් හා බම්බලපිටියේ වජිරාරාමාධිපති වැ වැඩ විසූ අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් ගේ ආචාර්යත්වයෙන් 1926 ජූලි 24 වන දින පැවිදි දිවියට ඇතුළත් වූ මඩිහේ පඤ්ඤාසීහ ස්වාමීන් වහන්සේ 1933 ජූනි මස 9 වන ද අධිශීල සංඛ්‍යාත උපසම්පදව ලැබූහ.

1941 වසරෙහි දී මහාචාර්ය ගුණපාල මලලසේකර මහතාගේ පුරෝගාමීත්වයෙන් කොළඹ විශ්වවිද්‍යාලයයෙහි ඇරැඹුණු විද්‍යා විශාරද උපාධි පාඨමාලා විභාගයෙන් උසස් ලෙස සාමර්ථ්‍යය ලැබූ තුරුණු වියේ පසු වූ පඤ්ඤාසීහ ස්වාමීන් වහන්සේ පළමු විදේශ ධර්මදූත සේවාව වශයෙන් 1946 දී තායිෂු චීන මහායතිවරයාණන් ගේ ඇරැයුමෙන් වජිරාරාමවාසී ව වැඩ විසූ සෝම ඛේමින්ද හිමිවරුන් සමඟ චීනයට වැඩම කෙළේ එරටට ථේරවාද බුදු සසුන හඳුන්වාදීම පිණිස ය.

බුරුමයේ පැවැති ඡට්ඨ සංගායනාවේ පඨමක සුද්ධි කමිටුවට 1954 දී තේරී පත් වූ උන්වහන්සේ එම වසරේදීම ලක්දිව සමාජ පරිවර්තනයකට තුඩු දුන් බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවෙහි ද බුද්ධ ජයන්ති ත්‍රිපිටක මණ්ඩලයෙහි ද සමාජිකයෙකු වශයෙන්

ක්‍රියා කළහ.

ස්වකීය ගුරුදේව පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමියන් ගේ අපවත් වීමෙන් පසු අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහානිකායයේ මහානායක ධුරයට 1955 නොවැම්බර් 27 වනදා තේරීපත් වුණු උන් වහන්සේ අඩු වයසින් මහානායක ධුරයට පත් වූ තෙරණුවන් ලෙස ඉතිහාස ගත වෙති. අනතුරුව කොටස් විසි ගණනකට වෙන් වී තිබුණු අමරපුර නිකාය එක්සත් කොට සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාව පිහිටුවීමට මූලික වූ උන් වහන්සේ 1966 දී එහි උත්තරීතර මහානායක ධුරයට ද පත්වූහ.

අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ ලෝසසුන් සේවාවේ අතිශයින් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් වන්නේ 1958 අප්‍රේල් 21 වන ද මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය (භික්ෂු අභ්‍යාස මධ්‍යස්ථානය) ආරම්භ කිරීමත් සමග ය.

1964 වර්ෂයෙහි ආසියා පදනමේ ආරාධනය අනුව ලෝක සංචාරයක යෙදුණු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට (ඕල්කට් ගුණසේකර මහතා ද කැපකරු දයක මහතා ලෙසින්) ඇමරිකාවේ ප්‍රථම ථේරවාද මධ්‍යස්ථානය වන වොෂින්ටන් බෞද්ධ විහාරය පිහිටුවීමට අවස්ථාවක් උදා වූයේ මේ ගමනේ ප්‍රතිඵලයක් වශයෙනි.

මෙසේ දශක සතකටත් වැඩි කාලයක් මුළුල්ලේ ස්වකීය සඵල ශ්‍රමණ ජීවිතයෙන් ලොවට සිදුකරන ලද අනුපම යුග මෙහෙවරට උපහාර දක්වීම සඳහා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨයෙන් ප්‍රවචන විශාරද සම්මානය ද, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍ය චක්‍රවර්ති උපාධිය ද, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සංගමයෙන් සම්මාන පණ්ඩිත උපාධිය ද, මියන්මා (බුරුම) රජයෙන් අග්ගමහාපණ්ඩිත උපාධිය ද, තායිලන්තයේ චූලාලංකාර විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ද, ශ්‍රී රෝහණ සංඝ සභාවෙන් ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය සම්මානය ද, උන්වහන්සේ වෙත පිරිනමා ඇත.

මේ සියල්ල හැරුණු විට සංඝ සාමග්‍රිය උදෙසා පමණක් නොව ජාතික සමගිය උදෙසා ද ජාතික ගැටලු විෂයයෙහි ද මහානායක

ස්වාමීන්ද්‍රයන් වහන්සේ තරම් පරහිතකාමී ව, එඩිතරව හඬ නැගූ කෙනෙකු පැවිදි සමාජයෙහි මතු නොව, ගිහි සමාජය අතර ද නොවෙති'යි කිවහොත් එය කෙසේවත් මුසා බස් බිණීමක් නො වන්නේ ය.

මිනිහා නොහඳ රට හදන්න බැහැ, මිනිහාත් හද ගනිමින් රටත් හද ගනිමු - යන උදර සංක්ලපය පෙරදැරි කරගෙන සමස්ත බෞද්ධ ලෝකයාටත් ශ්‍රී ලාංකේය ජනතාවටත් ශාසනික ජාතික හා සමාජීය වශයෙන් අනුපම වූ යුග මෙහෙවරක් සිදු කරමින් විශේෂයෙන් රෝහණ දේශයට මහත් අභිමානයක් ගෙන දුන් අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 91 වන වියෙහි දී (2003.09.08) සියලු සංස්කාර ධර්මයන් ගේ අනිත්‍යතාවය පළ කරමින් සිහි නුවණින් යුතුව අපවත් වූ සේක.

සම්බුද්ධ ශාසනයටත්, ශ්‍රී ලාංකේය ජනතාවටත්, බුදුනු ලොවටත් ධර්ම සාහිත්‍යයට හා සිංහල භාෂාවටත් අනුපම වූ විශිෂ්ට සේවාවක් සිදු කළ සංඝපිතෘන් වහන්සේ නමක් වූ ශ්‍රී ලංකා අමරපුර මහානිකායයේ උත්තරීතර මහානායක අග්ගමහාපණ්ඩිත පරමපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ 10 වන ගුණ සමරුව හා උපත් සියවස සපිරීම මේ වර්ෂයේ (2013) ජූනි මස 21 වන දට යෙදී ඇත.

අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනූඑක් වසරක් වූ ජීවිතයෙන් සැත්තෑ වසරක් ම ගත වූයේ සසුන්ගතව ය. එම උත්තම පැවැත්ම වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම බහුජනහිත පිණිස බහුජන සුව පිණිස ම වූහ. මෙලෙස අනවරතයෙන් පරාර්ථය වෙනුවෙන් කැපවී ක්‍රියා කළ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත්වන විට සියවසක මෙහෙවරක් ඉටුකර හමාර ය. උන් වහන්සේගේ ජීවිතය අසිරියක් වන්නේ මේ නිසා ය. උපත් සියවස සපිරීම සමරන මේ අවස්ථාවේ වුවත් ඒ ගුණ සුවඳ නැවුම්ව අපට දැනෙන්නේ ඒ මහා මෙහෙවරෙහි ඇති පුළුල් බව නිසාම ය.



# නමින් මිනිසෙක් උසස් නොවේ

**අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනායක**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ලියන ලද්දකි**

බෝසතාණන් වහන්සේ පෙර ජාතියක දී තක්ෂලා නුවර උපන්නාහ. හොඳට ඉගෙනීම කළ නිසා ඒ දිසාවේ ම ප්‍රධාන ගුරුවරයා වූහ.

මේ ගුරුවරයා ළඟ සිටි ගෝළයන්ගේ නම් එක එක විදිය ය. එක් කෙනෙකු ගේ නම පාපක ය. එහි තේරුම පව් කරන්නා යනුයි. එහෙත් ඒ හොඳ ළමයා පව් කරන කෙනෙක් නොවේ.

අනෙක් ළමයි විහිලුවටත් එක්ක ''පාපක -පාපක '' පව් කරුවා - පව් කරුවා යයි කියා කතා කරති. මේ ළමයාගේ හිතට හරි ලැජ්ජයි. මා පව් කරන්නේ නැත. එහෙත් මගේ නම පව් කරුවා ය. '' මාත් ගුරුතුමාගෙන් අහලා හොඳ නමක් තබා ගන්නට ඕනෑ යැ'යි සිතූ පාපක ගුරුතුමා ළඟට ගොස් ආචාර කළේ ය.

ගුරුතුමා- මොක ද ළමයා මේ අවේලාවේ ?

පාපක - ගුරුතුමාණෙනි, මගේ නම හොඳ නැහැ. මට අනෙක් ළමයින් නිතරම විහිලු කරනවා. ඒ නිසා මා ආවේ හොඳ නමක් ඉල්ලා ගන්නට යි''

ගුරුතුමා - ඒක බොහොම හොඳයි. එහෙත් මා දෙන නමත් නරක් වුණොත් ? ඒ නිසා ඔබ ම හොඳ නමක් සොයාගෙන එන්න. මා ඔබට නිවාඩු දෙනවා, යන්න නගරයේ ඇවිද හොඳ නමක් සොයාගෙන එන්න.

පාපක පිටත් වී ගියේ ය. අතර මග දී මළ මිනියක් පුළුස්සන්නට ගෙන යනවා දැක, මේ මළතැනැත්තාගේ නම කුමක් දැයි ඇසුවේ ය. ''නම ජීවක'' තේරුම ජීවත් වන්නා යනු යි.

ජීවකත් මැරෙනවා දැයි පාපක ඇසුවා ම ''මොනව ද ළමයා, නම නිකම් අඳුනා ගැනීමට බව දන්නේ නැද්ද'' යි ඒ මිනිස්සු කීවෝ ය.

ජීවකත් මැරෙනවා නොවැ ? කියා සිතමින් පාපක ඉදිරියට ගියේ ය. ටික දුරක් යන විට ගෑණියකට ගහනවා දුටු පාපක, අනේ මේ මොකද ගහන්නේ කියා ඇසුවේ ය.

මේ හිගන්නී මගේ මුදල් අරගෙන දෙන්නේ නෑ නොවැ යි ඒ තැනැත්තා කීවේ ය.

පාපක - ඔබේ නම කුමක් ද?

ගැහැණිය - මම ධනපාලී

නම ධනපාලී , එහෙත් හිගන්නී. මොකක් ද මේ නමින් ඇති වැඩේ සිතා හොඳ නමකට තුබුණු ආසාව ද අඩු වූ පාපක තවත් ඉදිරියට ගියේ ය.

හේ පාර වැරදී වට පිට බලමින් ඉන්නා මිනිසකු දුටුවේ ය.

පාපක - ඔබේ නම කුමක් ද?

මගියා - මගේ නම පන්ථක. එහි තේරුම පාරේ වූ තැනැත්තා යනුයි.

පාපක - මේක හරි වැඩක් නොවැ ? පත්‍රයකටත් පාර වැරදිලා, හරි පුදුම වැඩක් නෙ, ජීවකත් මැරිලා, ධනපාලී හිඟන්නී, ඉතින් නමෙන් ඇති වැඩේ මොකක් ද?

පාපකට හොඳ නමකට තුබුණු ආසාව නැති වී ගුරුතුමා වෙතට ගියේ ය.

ගුරුතුමා - කොහොම ද ළමයා නමක් සොයා ගත්තා ද?

පාපක - ගුරුතුමාණෙනි, හොඳ නමක් සොයා ගියා. එහෙත් අතර මග දී මට තේරුණා නමින් පමණක් වැඩක් නැත කියා. ඒ නිසා මා ආපසු හැරී ආවා. මට මේ නම ම හොඳයි.

ගුරුතුමා - බොහොම හරි ළමයා, නම කුමක් වුවත් වැඩ හොඳ නම් නමත් හොඳ වෙනවා ම යි.

නමින් මිනිසෙක් උසස් නොවේ. උසස් ගුණ ඇති මිනිසකු ගෙන් නමක් උසස් වේ. සැරියුත් මුගලන් ආදී නම් උසස් වූයේ තේරුම් නිසා නොවේ. ඒ තිබුණු අයගේ උසස් ගතිගුණ නිසා ය.

දේවදත්ත යනු දෙවියන් දුන් පුතා යන තේරුම යි. එහෙත් ඒ නම තුබුණු තැනැත්තා කළ නරක වැඩ නිසා ඒ නමට කව්රුන්වත් කැමති නැත.

අප ද නමින් උසස් වන්නට සිතන්නේ නැති ව උසස් වැඩවලින් නම උසස් කරන්නට සිතට ගත යුතු ය.

''බෞද්ධ ළමයා''



# සත්ත්ව කරුණාව

**අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ලියන ලද්දකි**

අනුන්ගේ දුකෙහි දී හිත කම්පා වීම කරුණා නම් වේ. මිනිසුන්ගේ හෝ තිරිසනුන්ගේ හෝ දුකක් දුටු විට සත්පුරුෂයන්ගේ හිතෙහි කරුණාව පහළ වෙයි. අපේ බුදුරජාණන් වහන්සේ තරම් කරුණාවන්තයෙක් මේ ලෝකයෙහි කොහිවත් සිටියේ නැත. උන් වහන්සේ අනුන්ගේ දුක් දුටු විට තමන්ගේ සැප පහසු නොබලා ඒ දුක් නැති කරන්නට උත්සාහ ගත් වාර බොහෝ ය.

ඉස්සර රජගහ නුවර සෝපාක නම් දරුවෙක් සිටියේ ය. මේ දරුවා මාස හතරේ දී තාත්තා මළේ ය. තාත්තා ගේ මල්ලී දරුවා බාර ගත්තේ ය. මේ බාප්පා දවසක්, "මූ මගේ පුතා සමඟ කෝලහාල කරනවා" යයි තරහ වී සෝපාක අල්ලා ගෙන අමු සොහොනට ගියේ ය. අසරණ සෝපාකගේ අත් දෙක බැඳ මළ මිනියකට තබා බැන්දේ ය. බාප්පා ගෙදර යන්නට පිටත් වුණේ, "තෝ සිවලුනට බත් වේවා" කියා ගෙන ය.

ටිකෙන් ටික රෑ වුණා. හත් අවුරුදු වයසේ කුඩා සෝපාකට තනියටවත් කවුරු හෝ නැත. වටින් පිටින් ළං වන සිවලුන් දැක සෝපාකට ඇති වූයේ කියන්නට බැරි තරම් බියෙකි.

"අනේ, මගේ කුමන වරදක් ද? අනේ අම්මත් තාත්තාත් නැති

මා හට පිහිට වන උතුමා කවු ද? කියමින් ඇඬුවේ ය. ඒ වේලාවේ දී අපේ බුදුපියාණන් වහන්සේ 'එන්න, පුතා, සෝපාක පුතා, බිය වන්න එපා පුතා ' කියා සෝපාක බේරා ගත් සේක.

බලන්න අපේ බුදුරජාණන් වහන්සේ දුකට පත් ළමයින් හට කොපමණ කරුණා කළා ද කියා.

තවත් දවසක් බුදුරජාණන් වහන්සේ මඟ වඩිනා විට සතකුට හිංසා කරන ළමා පිරිසක් හමු විය.

බුදුරජාණන් වහන්සේ : ''ළමයිනි, මේ මොනවා ද කරන්නේ?''

ළමයි : ''අප මේ සර්පයකුට ගහනවා''

බුදුරජාණන් වහන්සේ : ''ඇයි ළමයිනි, ඒ අසරණ සතාට හිංසා කරන්නේ ''?

ළමයි : ''මූ අපට දෂ්ට කරන නිසා ''

බුදුරජාණන් වහන්සේ : ළමයිනි එහෙම කරන්න හොඳ නැහැ. වෙන අය ඔය ළමයින් හට ගහනවාට ඔය ළමයින් කැමති නැතිවා වාගේ ඒ සතාත් ඔය ළමයින් ගහනවාට කැමති නැහැ. ඒ නිසා ඒ දුප්පත් සතාට හිංසා කරන්නට එපා.''

ළමා බසින් කියූ මේ බණ අසා ඒ ළමයි ඉන් පසු සතුන් හට හිංසා නොකළහ. අපේ බුදුරජාණන් වහන්සේ මේ වාගේ දුප්පතුන් හට කරුණා කළ වාර බොහෝ ය.

අපිත් මේ කරුණ සිතට ගෙන කිසි ම සතකුට හිංසා නො කරමු. කරුණා කරමු. අපේ ගෙවල්වල ඉන්නා බලු බළල් ආදී සතුන් තමන්ගේ දෙමවුපියන් මෙන් සිතන්න. දරුවන් මෙන් සිතන්න. සහෝදර සහෝදරියන් මෙන් සිතන්න.

මා නිසා අන් කිසිවකුට කරදරයක් නොවේවා යි නිතර ම සිතන්න. ඒ ලෙසට වැඩ කරන්න.



# අප අඳුරින් මිදූ මිහිඳු හිමි

හෙළ ජාතියේ ඇතිවුණු ද    පුනරුදය
දිස්වූයේ අදත් දිස්වන    පුරහඳය
යන්තම් මුල් වතාවට දහමක    පදය
දිව ගෑ සුබ මොහොත සමරන දින    අදය

නගරය අනුරපුර සැලසුම්ගත    වීම
පන්සල ඉදිව මහ පිරිවෙන බිහි    වීම
සව් සිප් කලා මුළු රට තුළ    වැපිරීම
හිමියනි ඔබෙන් ඉටුවුණි මේ හැම    දේම

නිම නොකළැකි වණා මොකඳුරු ගුණ    නවය
සිල් පද පහක් ළං වන ලොව්තුරු    සුවය
පෙන්වා හිමි දුන්හ ජාතියකට    ජවය
නොලදොත් ඉන් පලක් ඒ ඔහුගෙ ම    පවය

රඳවා තබා ‘නොදැනුම’ සෑහෙන    දුරක
‘දැනුම’ට පණ දෙමින් නොදියුණු    පරපුරක
දොරගුල් විවර කර සැඟවුණු බිහි    දොරක
හිමි පෙන්වා දුන්හ දැයකට හොඳ    නරක

හිමි නොතැබුවේ නම් මේ ලක්බිමෙහි    පයක්
අද අපටත් උරුම දැඩි උණු නොවන    ළයක්
දැය ලෙස හැඳින්විය හැක්කෙත් කුරිරු    දැයක්
එය සිහි වෙද්දි ඇතිවෙයි ළය සැළෙන    බියක්

නැතිවෙයි අපට බුදු දම් හා සඟ    සරණ
සෙන්කඩගලින් නොනගී දළද    කිරණ
නොදිලෙයි රුවන්මැලි සෑයෙන් ලක්    දෙරණ
නොලැබෙයි අපට සිරි මහ බෝ    රැකවරණ

**ධනපාල නිශ්ශංක මහතා විසිනි**



# ගුරු පියාණන් වහන්සේගේ පා පියුම් වැඳීම

**බෞද්ධ ළමයා 2481 වෙසක් කලාපයෙනි**

මේ උතුම් වෙසක් ද ද, හැම ද ද, කළ ගුණ දන්නා , කළ ගුණ සලකන පින්වත් දරුවෝ තමන්ගේ ආචාර්යෝත්තමයාණන් වහන්සේ වඳිත්වා !

සික්ඛාපෙත්වා මමං නිච්චං - අභිවුද්ධිඤ්ච කාරයී

තං මෙ සුගරුනො පාදං - සබ්බද හි නමාමාහං

යම් ආචාර්යෝත්තමයාණන් වහන්සේ කෙනෙක් හැම කල්හි ම අනුකම්පා පෙරදැරි ව මා හික්මවමින් සිතිනුත් කයිනුත් ගුණයෙනුත් නුවණිනුත් මෙ ලොවිනුත් පරලොවිනුත්, මා දියුණු කළ සේක් ද,

''මම මාගේ ඒ මහා කරුණා ඇති ගුරු පියාණන් වහන්සේගේ පා පියුම් හැම කල්හි ම ඉතා ආදරයෙන් වඳිමි'යි කියා පින්වත් දරුවෝ තම ගුරුතුමාණන් වහන්සේ හට වඳිත්වා !

තවද පින්වත් දරුවෝ මෙසේ ද පතත් වා !

අනේ මම මාගේ ගුරු පියාණන් වහන්සේගේ පයේ දූවිලි වම් වා !

අනේ මම මාගේ උතුම් ගුරු පියාණන් වහන්සේ ගේ පා පිස්නට පා පිස්නක් වම් වා !

අනේ මාගේ ගුරු පියාණන් වහන්සේගේ පයට පියුම් පිපෙත්වා !

අනේ මාගේ ගුරු පියාණන් වහන්සේ තිලෝගුරු ම වන සේක් වා !

ධර්මද්වීපවාසී පින්වත් දරුවෝ අද ''ඉමාහං භන්තේ අත්තභාවං තුම්හාකං පරිච්චජාමි''යි කියා තමන්ගේ ජීවිතය ද තමන් විසින් සංසාරයේ දී රැස් කර ගන්නා ලද සියලු පින් ද තමන්ගේ උතුම් වූ ගුරු පියාණන් වහන්සේ හට පූජා කෙරෙත් වා !

# අඳුරු යි තව ම සිරිලක

කුමට රන්තරු අහසේ පායා
සුපුන් සඳ දැන් බැස ගිහින්
සුවඳ නැති මල් කුමට පිපුණි ද
සුසුදු මල පරවී ගොසින්
තුරු වියන් මත ගැයූ විහඟුන්
ගොළු වේලා ඈතට ගිහින්
මහා නාහිමි නැති සොවින්
සිරිලක ම අඳුරුයි ඉතින්

ගුණෝන් සුවඳින් පිරුණු සමිඳුන්
පියුමෙකැයි විටකදි හිතෙයි
පිරී ඉතිරී ගලන ගඟුලක
තේජවත් බව මට පෙනේ
මුව කමල පිරි සිහින් සිනහව
කිසි දිනක අමතක නොවේ
නැවත කවදා දකිනු හැකි වෙ ද
නා සමිඳු සිරිලක් බිමේ

**පියුමි ජයවර්ධන**



# මඩිහේ මහ නා හිමි සිරිතින් කුඩා ළමයිනට උපදෙස්

**"ගුරු සීයා" විසිනි**

අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන් වහන්සේ කියන්නේ මෑත යුගයේ සංඝ සමාජයේ පහළ වුණු අතිශයින් දුර්ලභ උත්තම චරිතයක්. උන් වහන්සේ උපත ලබල මෙම ජුනි මාසයේ 21 වනදට හරියට ම වසර සියයක් සම්පූර්ණ වුණා. උන් වහන්සේ උපත ලැබුවෙ 1913 ජුනි 21 වෙනිදා.

1926 ජුලි 24 වැනිදා මාතර කඹුරුගමුවේ දේවගිරි විහාරය කියන පන්සලේ දී, එහි විහාරාධිපති අතිගරු වේරගම්පිට සිරි රේවත කියන ලොකු හාමුදුරුවන් ගේ ආචාර්යත්වයෙන් ''පඤ්ඤාසීහ'' නමින් පැවිදි වුණු පොඩි හාමුදුරුවෝ 1933 ජුනි 9 වනදා උපසම්පදා වුණා. ඒ කියන්නේ පැවිදි ජීවිතයේ උසස් ම ශීලය සමාදන් වෙලා මහා සංඝරත්නයෙන් භික්ෂු භාවය ලබා ගත්තා.

බම්බලපිටියේ වජිරාරාමය ආරම්භ කළ අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක හාමුදුරුවන්ගේත් ගුරුදේවයන් වහන්සේ වුණේ වේරගම්පිට රේවත ලොකු හාමුදුරුවෝ. පඤ්ඤාසීහ පොඩි හිමියන් පැවිදි වෙන කොට පැළෑණේ මහානායක හාමුදුරුවන්ට අවුරුදු 50 ක් පමණ වයස. පසුකලෙක පැළෑණේ මහ නාහිමියන් කුඩා සාමණේර නම වජිරාරාමයට කැඳවාගෙන අවුත් උන්

වහන්සේ ගේ ශිෂ්‍යයකු ලෙස ධර්මශාස්ත්‍ර ප්‍රගුණ කරවමින් ශික්ෂණය ලබා දෙමින් සසුන් උරුමය ලබා දුන්නා.

පඤ්ඤාසීහ පොඩි හාමුදුරුවෝ සාමණේර කාලේත් පසුව තරුණ කාලේත් බොහොම උපශාන්ත ඉරියවු තිබුණු කෙනෙක්. පන්සලට ආගන්තුක ව එන හාමුදුරුවරුන් හා දයක පිරිසත් උන් වහන්සේට කතා බහ කළේ බොහොම ආදරයෙන්, බොහොම පැහැදීමෙන්. පන්සලට වැඩම කරන හාමුදුරුවරුන් පෙර ගමන් ගිහින් පිළිඅරගෙන, නිසි වත් පිළිවෙත් දැක්වීම මේ පුංචි හාමුදුරුවෝ බොහොම ප්‍රිය කළ දෙයක්.

වැඩිහිටි හාමුදුරුවන් කෙරෙහි පොඩි හාමුදුරුවන්ට තිබුණේ ලොකු ගෞරවයක්. ගුරු හාමුදුරුවන්ට උපස්ථාන කිරීමත් උන්වහන්සේ ඉතා හොඳින් සිදු කළා. 1955 සැප්තැම්බර 21 වැනිද ගුරුදෙවි පැළෑණේ මහනායක මාහිමියන් වහන්සේ අපවත් වුණා. එයින් මුළු ලංකාවත් බෞද්ධ ජනතාවත් කම්පනයට පත් වුණා. එච්චරට ම උන් වහන්සේ අපවත් වීමේ පාඩුව ලංකාවාසී ජනතාවට දැනුණා. ඒ අපවත් වීමෙන් පස්සේ, උන් වහන්සේ දැරූ අමරපුර ධර්මරක්ෂිත නිකායේ මහානායක පදවියට පත් වුණේ මඩිහේ පඤ්ඤාසීහ හාමුදුරුවෝ. ඒ මහානායක පදවිය පිළිබඳ අක්ත පත්‍රය නිකායේ වැඩිහිටි ම ස්වාමීන් වහන්සේ ගෙන් ලබා ගන්න තමයි මේ අභිනව මහනාහිමියන් කැමැති වුණේ. වැඩිහිටි ගෞරවය කියාපාන තවත් නිදසුනක් මේක.

මඩිහේ මහානායක මාහිමිපාණන් වහන්සේ බොහොම නිරහංකාර පැවැතුම් ඇති උතුමෙක්. මහානායක පදවිය පිළිබඳ අක්ත පත්‍රය ලබන උත්සවයේ දී උන් වහන්සේ වෙසෙසින් සිහිපත් කළේ, එද වැලිවිට සරණංකර මාහිමියන් සංඝරාජ පදවියට පත් වුණු වේලේ උන් වහන්සේ විසූ ලැගුම් ගෙයි උලුවස්සේ ''උඩඟු නොවා මහණ'' කියලා ලියා තැබූ වගන්තිය යි. සැබැවින් ම මහානායක හාමුදුරුවෝ පුංචි ළමයකු වගේ බොහොම නිහතමානි උතුමෙක්. මහානායක මාහිමියන් පිළිබඳව

බොහොම භය පක්ෂපාත ව සිතූ බොහෝ දෙනා උන්වහන්සේ අබිමුවට ගොස් සතුටු සාමිචි කථා කළා ම ඉතා පුදුමයට පත් වුණා.

මහානායක මාහිමියන් වහන්සේ කලට වේලාවට වැඩ කළ උතුමෙක්. උත්සව සභාවකට වුණත් කලින් සුදනම් වී නියමිත වේලාවටත් කලින් වැඩම කිරීම උන් වහන්සේ ගේ සිරිතක්. කරන දෙයක් හරියට සකසා සපුරා කිරීම බුද්ධාවවාදයක් බව උන් වහන්සේ නිතර ළමයින්ට මතක් කර දුන්නා පමණක් නොව, එය හරියට ම පිළිපැද්ද.

මඩිහේ මහානායක මාහිමියන් වහන්සේ තරම් ජාතික - ආගමික ප්‍රශ්නවල දී අභීත ව ක්‍රියා කළ, පුවත්පත් ලිපි ලියමින් රජයත් ජනතාවත් දැනුම්වත් කරමින් උපදෙස් දුන් වෙනත් යතිවරයකු සොයාගන්නට බැහැ. ඇතැම් කරුණු පිළිබඳ ව එඩිතර ව තදට ලිව්වා, කථා කළා. එහෙත් කිසි විටකවත් පුද්ගල දෝෂාරෝපණ, අපහාස, චරිත ඝාතන උන් වහන්සේ සිදු කෙළේ නැහැ. විවේචනයට පාත්‍ර වන අය වුණත් උන් වහන්සේ ගේ ජාතික හැඟීම හා කැක්කුම හොඳින් තේරුම් ගත්තා.

අනෙක් සුවිශේෂී කරුණක් තමයි උන් වහන්සේ මොන තරම් සමාජ සේවා ආදි කටයුතුවල නිරත වුණත් ඒ එකකින් වත් තමන් වහන්සේ ගේ මහණකම කිලිටි කරගත්තේ නැහැ. උන් වහන්සේ ප්‍රගුණ කළ විනයානුකූල ඇවැතුම් පැවැතුම් කවර කරුණක් නිසාවත් ලිහිල් කරගෙන ක්‍රියා කළේ නැහැ. වර්තමානයේ සමාජ සේවාවල නිරත වන තරුණ ස්වාමීන් වහන්සේලාට මෙය මහා ආදර්ශයක්.

මහානායක හාමුදුරුවෝ බෝධිසත්ත්වවරයෙක්. බෝසතාණන් වහන්සේ තමන් දුක් විඳිමින් අන් අයට සුවය, යහපත සැලැසූ චරිතයක්. කරන ක්‍රියාවේත් සිතන සිතුවිල්ලේ ත් පරමාර්ථය අරමුණ ගැඹුරින් දැක එය සාක්ෂාත් කරගැනීම මිස පෞද්ගලිකත්වයක් වත්, ලාභ කීර්ති ප්‍රශංසාවක් වත්, එහිලා

සැලකුවේ නැහැ. තමා ගේ සුවය, සම්පත, හැකියාව අනුන්ගේ සුවයට යහපතට අත්හැරීම උන්වහන්සේලාගේ සහජ ලක්‍ෂණයක්. මහානායක මාහිමිපාණන් වහන්සේගේ ජීවිතය තුළින් අප දක්කේ මේ බෝසත් චරිත ලක්‍ෂණ.

කාලය නො බලා, වෙහෙස නො බලා, අපහසුකම් නො බලා නොදියුණු ගම් දියුණු කිරීම, ගැමි දුප්පත් ජනතාවගේ ආර්ථික තත්ත්වය උසස් කිරීම, මත්පැන්, සූදු, මත්ද්‍රව්‍ය දුසිරිත්වලින් ජාතිය බේරාගැනීම, පන්සිල් සුරකින දැහැමි සමාජයක් හැදීම ආදි උතුම් ව්‍යායාමවල උන් වහන්සේ යෙදුණු ආකාරයත් අර බෝසත් සිරිත් ම සිහි ගන්වන්න ක්.

බොහෝ දෙනා දන්නා ආකාරයට මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට මේ තරම් උසස් සේවාවක් කරන්නට ලැබුණේ උන් වහන්සේ ගේ ම සුසිල්වත් බවත් ගුණවත් බවත්, කාටවත් වරදක් පිළිබඳ ව ඇඟිල්ල දිගු කළ පෙන්වීමේ හැකියාවක් නොහැකි වීමත් යන කරුණු පදනම් කරගෙන යි.

ඉවසීමේ ගුණය හා ධෛර්ය සම්පන්න භාවය මහනාහිමි සිරිතේ වෙසෙසින් කැපී පෙනුණු ගුණ දෙකක්. දැඩි කායික වේදනාවක් වුව ද අනුනට හිරිහැරයක් වේ ය යන සිතින් දෝ ඉවසා ගෙන සිටි අයුරු ආදර්ශවත්.

''මිනිහා නො හදා රට හදන්න බැහැ, මිනිහාත් හදගනිමින් රටත් හදගනිමු'' යන්න මහානායක මාහිමිපාණන් ගේ සමාජ නියාමන ආදර්ශ පාඨය යි. අතිපූජනීය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ මහරු මෙහෙය අගයන, ගුණ සමරන සියලු දෙනාගේ ම පරම අරමුණු විය යුත්තේ මෙම ආදර්ශ පාඨය අනුව මිනිහා හෙවත් මිනිස් මනස හදගැන්මට හැකිතාක් අවංක ව වීර්ය කිරීම ය. මහ නා හිමියන් සිදු කළ උදාර මෙහෙවර සක්‍රිය ව සජීවී කිරීමට සත්පුරුෂ හැම දෙනා ම නිරතුරු ව උත්සාහවත් වෙත් වා !



# වට්ටක ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය**

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ, භික්ෂූන් වහන්සේලාහට වට්ටක ජාතකය දෙසූයේ, එකල දඹදිව මගධ දේශයෙහි වනපෙත් දවාලු ළැව්ගින්නක් නිසාවෙනි. එකල ඉතා දරුණු නියං සමයක් වූ නිසා මුළු වනයේ ම ගස් කොළන් දැවී යන්නට පටන් ගති. මිනිසුන් මෙන් ම සත්තු ද තම ජීවිත බේරාගැනීමට උත්සාහ කළහ. මේ වන විට බුදුරජාණන් වහන්සේ පිරිවර භික්ෂූන් වහන්සේලා සමග මගධ දේශයෙහි සදහම් චාරිකාවෙහි යෙදී සිටියහ.

ගම් නියම් ගම් පසුකර වනය හරහා ගමන් කරමින් සිටි බුදුපිරිස ළැව් ගින්න තමන් දෙසට පැතිර එනු දක බියට පත්වී බුදුපියාණන් වහන්සේ වටා රොක්වූහ. සමහර භික්ෂූන් වහන්සේලා අවට තිබූ ගස් කොළන් ගිනි තබන්නට පටන් ගත්හ. ඒ ගස් කොළන් දැවුණු පසු නැවත ලැව්ගින්න නොපැතිරෙන නිසා ය. අනෙක් භික්ෂූහු මේ කුමක් කරන්නෙහි ද? ඔබ වහන්සේලා අප බුදුරජාණන් වහන්සේගේ බල නොදන්නෙහු ද යි විමසා සිටියහ. අප බුදුරජාණන් වහන්සේ අසලට ම පැතිරී ආ ගින්න, එකෙණෙහිම නිවී ගියේ ය. භික්ෂූහු බුදු බලය මෙන් ම බුදු මහිමය ගැන සාකච්ඡා කරන්නට පටන් ගත්හ. පුදුමයට පත්වූහ. මෙය අසා සිටි බුදු පියාණන් වහන්සේ මෙම බලය ඈත අතීතයේ පටන් තමා වෙත තිබූ සත්‍ය ක්‍රියා බලයකැයි වදාළ හ. මේ අරබයා වට්ටක ජාතකය දෙසූ සේක.

ඈත අතීතයේ දී මගධ රටෙහි එක් වනයෙක වටු කුරුල්ලෙකුව

උපන් බෝසතාණන් වහන්සේ මෙවැනි ළැව්ගින්නකට මැදි වූහ. ඉගිල යෑමට හෝ ඇවිද යෑමට නොහැකි වූ, ළදරු වියේ පසුවූ බෝසත් වටු කුරුලු පැටවා තම දෙමාපියන් සමග ජීවත් විය. හදිසියේ ම ඔවුන් ජීවත් වූ වනයේ ළැව්ගිනි පැතිර ගියේ ය.

මරණ බියෙන් සියලු සත්තු තැති ගත්හ. වටු කුරුලු මවත් පියාත් පැටවා ගෙනයන්නට, බේරාගන්නට උත්සාහ දැරූහ. අත්තෙන් අත්තට පියාඹමින් හඬන්නට වූහ. නොහැකි වූ තැන දෙදෙනාම හඬමින් ඉවත්වූහ. අසරණ වූ බෝසත් වටු කුරුලු පැටවා හිස ඔසවා කූඩුවෙන් පිටත බැලූකල ළැව්ගින්න කූඩුව වටකරමින් තිබුණි. ගිනිදැල් කූඩුව වටා තිබෙනු දුටුමුත් කුරුලු පැටවා නිසොල්මන් ව සත්‍ය ක්‍රියා කළේ ය.

"මගේ පියාපත් තවම වැඩී නැත. මගේ පාද ශක්තිමත් නැත. දෙමාපියනට දිව්ගලවා ගැනීමට යන්නට සිදුවිය. මට කිසිවෙකුහට පිහිට වන්නට නොහැකි බව මම දනිමි. මේ වනතුරු පෙරුම් පුරමින්, භවයෙන් භවයට මගේ ශීලය ආරක්ෂා කළෙමි. මේ ලොව පහළ වූ බුදුරජාණන් වහන්සේලා සියලු සතුන්හට මෛත්‍රී කළහ. සීල සමාධි ගුණයෙන් පිරිපුන් වූහ. එය සත්‍යයකි. උන්වහන්සේලා අවබෝධ කළ සත්‍යයේ බලයෙන් ද, මගේ සීලයේ සත්‍ය බලයෙන් ද මෙම ගින්න නිවේවා ! "

මෙසේ සිතා වටු කුරුලු පැටවා සත්‍ය ක්‍රියා කළහ. ගිනි ජාලාවක් මහා වැස්සකට නිවී යන්නා සේ ළැව්ගින්න නිවී ගියේ ය. එය ප්‍රාතිහාර්යයක් ම විය. සැවොම ගින්නෙන් බේරුණහ. වටු පවුල නැවත එකතු විය.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන්හට වට්ටක ජාතකය දේශනා කරමින් පෙර කල පටන් තමන් වහන්සේ සත්‍ය ක්‍රියා කළ බව පෙන්වා දුන් සේක. එකල වටුකුරුලු පැටවාගේ දෙමාපිය දෙදෙනා මෙකල ද දෙමාපියන් වන සුද්ධොදන රජතුමා හා මහාමායා දේවිය යි. වටු කුරුලු පැටවා අප බුදුපියාණන් වහන්සේ ය.

නිරතුරු ම සිල් රකින්නා පින්වන්ත ය. පිවිතුරු ය. එම සීලයේ සත්‍ය බලයෙන් සීලවන්තයා උවදුරු කරදර ආදියෙන් ආරක්ෂා වන්නේ ය. අප සැවොම සිල්වත් ව ජීවත් වුව හොත් නොයෙක් කරදර උවදුරු වලින් අප ද ආරක්ෂා වන බැව් නිසැක ය.

(කෙටි කතාව)



# මලක සුවඳ

සිරි වජිරාරාමවාසී
**පිටිපන සාසනරතන හිමිපාණෝ**

සමිත හා ආත්තම්මා අතර ඇති වූ සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස සමිත ආත්තම්මා සමග පන්සලේ පොඩි හාමුදුරුවෝ සොයාගෙන ගියා. පොඩි හාමුදුරුවෝ සමිතට සමහර අනුවණ මිනිසුන් නිසා මේ පරිසරයට ලෝකයට සොබා දහමට සිදු වූ දෙය කියා දෙන්නට රසවත් සූත්‍ර දේශනාවක් කියා දෙනවා. සූත්‍ර පිටකයේ දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍ර දේශනාව මූලික කරගෙන තමයි මේ කරුණු කාරනා සමිතට පොඩි හාමුදුරුවෝ කියා දෙන්නේ. පසුගිය කලාපයේ මේ ලෝකය ඇතිවීම වගේ ම මිනිසා ඇතිවුන ආකාරයත් පැහැදිළි කළා. අද එතැන් සිට............................................

මතකද පොඩි මහත්තයාට, අර ආභස්සර කියන ලෝකයෙන් පැමිණි පිටස්තර ජීවී පිරිස රස පොළව ආහාරයට අරගත්ත නිසා ඔවුන් මේ පරිසරයට අනුගත වූ මිනිසුන් පිරිසක් බවට පත්වුන හැටි........

එහෙමයි හාමුදුරුවනේ...........     මට මතකයි.......

රස පොළව ආහාරයට ගනිමින් මේ අය දීර්ඝ කාලයක් මිහිපිට වාසය කළා. කෙමෙන් කෙමෙන් ඒ පිරිසගෙ ශරීරයත්

රළු වුනා. දුර්වර්ණ වුනා. කොහොම උනත් මේ වර්ණ, දුර්වර්ණ වෙනස්කම් නිසා මේ පිරිසගේ මානය එන්න එන්න ම වැඩි වුනා. වර්ණවත් ශරීර ඇත්තෝ දුර්වර්ණ ශරීර ඇති අය දිහා අවතක්සේරු කරල බලන්න පුරුදු වුනා.

සමාවෙන්න අපෙ හාමුදුරුවනේ .................... අවතක්සේරු කියන වචනයේ තේරුම මට පොඩ්ඩක් කියලා දෙනවාද?

දැන් බලන්න පොඩි මහත්තයා අපි ජීවත් වන සමාජයේ මිනිසුන්ගේ ත් විවිධ ශරීර වර්ණ තියෙනවා.... පෙර අතීතයේ මේ ශරීර වර්ණය මත පදනම් වෙලා මිනිසුන් උස් පහත් විදිහට කොටස් කරල තිබුනා. බොහොම ලස්සන ශරීර වර්ණ තියෙන අය දුර්වර්ණ ශරීර වර්ණ ඇති අයට බොහොම පහත් විදිහට සැළකුවා. දැනුත් සමහර උදවිය ලඟ ඒ පරණ ගතිගුණ තවම තියෙනවා........ හැබැයි ඉතින් ඔය මොන පාට ශරීර වර්ණ තිබුනත් හැමදෙනාගේ ම ඇඟ ඇතුලේ දුවන්නේ රතු පාට රුධිරය යි.

මෙහෙම විවිධ විපර්යාස ඇතිවෙමින් ලෝකය තුළ පැතිරිලා තිබුන රස පොළව කෙමෙන් කෙමෙන් අවසාන වුනා. මේ රස පොළව නැතිවෙලා යනවාත් සමග ම අර පිරිසගේ ආහාර වුනේ පොළොවේ තැනින් තැන ඇති වුන බිම් හතු විශේෂයක්..... මේ සත්ත්වයන් පිරිස බිම් හතු ආහාරට ගත්තා. මේ විදිහට දීර්ඝ කාලයක් ගත වුනා. මේ පිරිසගේ අවාසනාවකට වගේ හටගත්ත බිම් හතු වර්ගයත් කාලයක් යනකොට අතුරුදහන් වෙලා ගියා.

දැන් මේ පිරිසට දවසින් දවස ආහාර හිඟයක් මතු වුනා. මේ ඇතිවුන අඩුව පිරිමැසීම ට " බදාලතා " කියල වැල් වර්ගයකුත් හට ගත්තා. මේ වැල් බොහෝ ම සුවඳයි. සමහර විට ඒ සුවඳ නිසා ම කෑම රුචිය ඇති වෙන්න ඇති. මේ පිරිස දැන් සතුටින් බදාලතා වැලුත් දීර්ඝ කාලයක් රස වින්දා.

පොඩි මහත්තයා ඊළඟට කාලයාගේ ඇවෑමෙන් වැල් වර්ගය ද අතුරුදහන් වුනා..............

සෑම දෙයම ඇති වෙනවා පවතිනවා නැතිවෙනවා..... කිසිවක් ස්ථිර නෑ. සොබා දහම තුළ සැමට ම පොදු වූ කාරණය මෙය යි.......

වැල් වර්ගයත් හිඟවීම නිසා ආහාර හිඟය උග්‍ර විදියට දැනුනා...... ඒ පිරිස දැන් හොඳටම අසරණයි. තවත් අලුත් සිදුවීමක් මේ අතර තුර සිදු වුනා. ආහාර හිඟය නිසා ම මේ සත්ත්වයන් පිරිසට දුක් වේදනා දැනුනා. මොවුන් හැඟීම් දැනීම් ඇති පිරිසක් බවට පත් වුනා........

බදාලතා වැල් දැන් මිහිපිට කොතැනකවත් දකින්නට නැහැ. මේ මහ පොළොවේ තැනින් තැන විශේෂ ධාන්‍ය වර්ගයක් හට ගත්තා. ආහාර නැතිව බොහො ම දුක් වේදනා විඳි පිරිසට මේ දෙය මහත් අස්වැසිල්ලක් වුනා. මේ ධාන්‍ය වර්ගය පොතු රහිත හැල් වී වර්ගයක්. මෙතැන් පටන් ඔවුන්ගේ ආහාරය වුනේ ස්වයංජාත හැල් වී වර්ගය යි. ආහාරයට ගත් විට නැවත නැවත මේ හැල් වී කරල් පීදුනා. බොහෝ කාලයක් සුවඳ හැල් වී, ඒ පිරිස ආහාරයට ගත්තා.

ස්වයංජාත හැල් වී ආහාරයට ගත් නිසා මේ අයගේ ශරීරවල තව තවත් වෙනස් කම් බොහෝමයක් ඇති වුනා. සත්ත්වයන් පිරිස ස්ත්‍රී පුරුශ ලෙස දෙපිරිසක් බවට පත් වුනා......... මෙහි අවසාන ප්‍රතිඵලය විදිහට මිනිසුන් තුළ පෞද්ගලිකත්වය වර්ධනය වුනා. ඔවුන් මේ මහ පොළොවේ තමන්ට ම කියල නිවාස ගොඩ නැගුවා. වර්ණ බේදය නිසා එකිනෙකා අතර ඇතිවුන දුරස් බව පෞද්ගලිකත්වය නිසා තව ටිකක් වැඩි වුනා...... මම මගේ කියන සිතිවිලි ඔවුන් තුළ ඇති වුනා.

(ලබන කලාපයට)



# පිය - පිතු දෙදෙනෙකු අතර වූ දෙබසක්

**“මුතු සීයා” විසිනි**

පුතා - තාත්තේ, මා ඔබෙන් ප්‍රශ්නයක් අහන්න ද?

පියා - සත්තකින් ම අහන්න. මොකක්ද දැන ගන්නට ඕනෑ ?

පුතා - ඇත්තට ම තාත්තා පැයකට කීයක් උපයනවා ද?

පියා - පාඩුවේ ඉඳිං, ඕනෑ නැති ප්‍රශ්න අහන්නේ නැතිව. ඒත් කියන්න ඇත්තට ම ඇයි පුතා එහෙම ඇහුවෙ?

පුතා - මට නිකං දැන ගන්නට හිතුණා. අනේ කියන්නකෝ පැයකට කීයක් හම්බ කරනවා ද?

පියා- ඕන්න, දැන ගන්න ඕන නම් කියන්නම්. මා පැයකට රුපියල් 1000ක් උපයනවා.

පුතා- (බිමට නෙත් යොමා ගෙන) "ඕහ් ! එපමණ?

එහෙනම් තාත්තේ මට රුපියල් 500ක් ණයට දෙන්නට පුළුවන් ද?

(පියාට තදින් ම කේන්ති ගියේ ය.)

පියා- "ඔබ ණයක් ගන්න හිතුවේ මොනවා හරි විකාර සෙල්ලම් බඩුවක් හරි වැඩක් නැති දෙයක් හරි ගන්නට නම්... කෙළින් ම යනවා කාමරයට, ගිහින් ඇඳට වැටිලා කල්පනා කර බලනවා ඔබ

කෙතරම් ආත්මාර්ථකාමි ද කියලා. හිතන්නට බැරි ද මම සැමදම කොතරම් මහන්සි වෙනවා ද මේ මුදල් උපයන්න කියලා ?

(පුතා බිම බලා ගෙන, සෙමෙන් සෙමෙන් තම කාමරයට ගොස් දොර වසා ගත්තේ ය.) මුදල් ටිකක් ලබා ගැනීමට පුතා එවැනි ප්‍රශ්නයක් ඇසීමට තරම් නිර්භීත වීම ගැන පියා කුපිත ව, තව තවත් කල්පනා කරන්නට විය. පැයකට පමණ පසු, ඔහු ගේ කෝපය සන්සිඳුණෙන්, "ඇත්තෙන්ම ඔහුට රුපියල් පන්සියයකින් මොනවා හරි වැදගත් දෙයක් ගන්නට උවමනා වෙන්නට ඇති. වෙනද ඔහු මගෙන් මෙසේ ඉල්ලන්නේ නැහැ නොවැ? යි කල්පනා කරමින් ඔහු පුතා ගේ කාමරය ළඟට ගොස්, පුතා, ඔයා නිදි ද?

පුතා- "නෑ තාත්තේ මම තාමත් අවදියෙන්."

පියා- ඒ වෙලාවේ මා ඔබට සැර වුණේ උදේ ඉඳං මහන්සි වෙලා සිටි නිසා, මෙන්න පුතා ඉල්ලපු රුපියල් පන්සීය."

පුතා ඉතා සතුටින් නැගිට ඇඳ මත වාඩි වී " ඕ, බොහෝම ස්තූතියි, තාත්තේ ! පසුව ඔහු කොට්ටය ඔසවා එහි යට සඟවා තුබු ගුලි කරන ලද නෝට්ටු කිහිපයක් එළියට ගත්තේ ය. පුතා ළඟ දැනටමත් තවත් මුදල් ඇති බව දුටු පියා, නැවතත් ආවේගශීලී විය. තමා ළඟ ඇති මුදල් ප්‍රමාණය සෙමෙන් ගණන් කළ දරුවා, හිස ඔසවා පියා දෙස බැලී ය.

පියා - ඔබ ළඟ ඔය තරමට මුදල් තියෙද්දී ඇයි තවත් මුදල් ඉල්ලුවේ ?

පුතා - මට අවශ්‍ය මුදල් ප්‍රමාණය කලින් තිබුණේ නැහැ. දැන් නම් තියෙනවා. තාත්තේ, දැන් මා ළඟ රුපියල් දහක් තියෙනවා. ඒ නිසා, ඔබ වැඩි වැඩියෙන් මුදල් උපයන්න ගත කරන වේලාවෙන් එක පැයක් මට මිළට ගත හැකි ද?

තාත්තේ හෙට පැයක් කලියෙන් ගෙදර එන්න. තාත්තත් එක්ක රෑ කෑම කන්න මට ආසයි" පියා ගේ සිරුර මුළුමනින් ම ඇඹරී ගියාක් මෙන් දැනෙන්නට විය. ඔහු තම දෑත් දරුවා ගේ සිරුර වටා යවමින් වැළඳ ගෙන, තමන් ගෙන් සිදු වූ වරදට කණගාටුව පළ කෙළේ ය.



# දන පාරමී

**අතිපූජ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේ විසිනි**

ඉද්ධි විධ හා නිවන් සැපත් නිපදවනු පිණිස යාන දන් දෙති. සිල් සුවඳ නිපදවනු පිණිස සුවඳ දන් දෙති. බුද්ධ ගුණ ශෝභාව නිපදවනු පිණිස මල්විලවුන් දන් දෙති. බොධි මණ්ඩාසනය නිපදවනු පිණිස ආසන දන් දෙති. තථාගත ශෛය්‍යාව නිපදවනු පිණිස ඇඳන් ආදී ශෛය්‍යාවන් දන් දෙති. ශරණ භාවය නිපවනු පිණිස ආවාස දන් දෙති. පසැස් ලැබීම පිණිස ප්‍රදීප දන් දෙති. ව්‍යාමප්‍රභාව නිපදවනු පිණිස රූප දනය කෙරෙති. බ්‍රහ්මස්වරය නිපදවනු පිණිස සද්ද දනය කෙරෙති.

සකල ලෝකයාහට ප්‍රිය භාවය පිණිස රස දනය කෙරෙති. බුද්ධ සුකුමාර භාවය නිපදවනු පිණිස ඵොට්ඨබ්බ දනය කෙරෙති. අජරාමර භාවය පිණිස බෙහෙත් දන් දෙති. සියලු සත්ත්වයන් ආර්ය ජාතියෙන් තමන්ගේ පුත්‍ර භාවයට පමුණුවනු පිණිස පුත්‍රයන් දන් දෙති.

සියලු ලෝකයාගේ ස්වාමී භාවයට පැමිණීම පිණිස භාර්යාවන් දන් දෙති. ධර්ම රාජ්‍ය ලබනු පිණිස රාජ්‍යයන් දන් දෙති.

වෙසතුරු අත් බැව් හිදී අට අවුරුදු වයසැති බෝසත් ළදරුවා ''ඉදින් මගෙන් යමෙක් හෘදය ඉල්වන්නේ නම් ළය පළා හදවත නිකුත් කොට ගෙන දෙන්නෙමි. ඉදින් ඇස් ඉල්ලන්නේ නම් ඇස් උපුටා දෙන්නෙමි. ඉදින් ඇඟ මස් ඉල්වන්නේ නම් සකල ශරීරයෙන් මස් සිඳ දෙන්නෙමි'යි සිතී ල.